# 6 වර්ගඵලය

**මෙම පාඩම ඉගෙනීමෙන් ඔබට**

- කේන්ද්‍රික ඛණ්ඩවල වර්ගඵල සෙවීමට,
- කේන්ද්‍රික ඛණ්ඩ ඇතුළත් තල රූපවල වර්ගඵලය ආශ්‍රිත ගැටලු විසඳීමට

හැකියාව ලැබෙනු ඇත.

## තල රූපවල වර්ගඵලය

වර්ගඵලය යටතේ ඔබ මීට පෙර උගත් විෂය කරුණු නැවත සිහිපත් කර ගනිමු.

| නම | තල රූපය | වර්ගඵලය ගණනය කරන ආකාරය | වර්ගඵලය ($A$) සඳහා සූත්‍රය |
|---|---|---|---|
| සෘජුකෝණාස්‍රය |   | දිග × පළල | $A = a \times b$ |
| සමචතුරස්‍රය |   | (පාදයක දිග)$^2$ | $A = a^2$ |
| සමාන්තරාස්‍රය |   | ආධාරකය × ලම්බ උස | $A = a \times h$ |
| ත්‍රිකෝණය |   | $\frac{1}{2}$ × ආධාරකය × ලම්බ උස | $A = \frac{1}{2} \times a \times h$ |
| ත්‍රපීසියම |   | $\frac{1}{2}$ × සමාන්තර පාද දෙකේ දිගෙහි එකතුව × ලම්බ උස | $A = \frac{1}{2}(a+b) \times h$ |
| වෘත්තය |   | $\pi$ × (අරය)$^2$ | $A = \pi r^2$ |

## පුනරීක්ෂණ අභ්‍යාසය

1. පහත දී ඇති එක් එක් තල රූපයේ වර්ගඵලය සොයන්න.




2. පහත දී ඇති $A$ හා $B$ රූපවලින් දැක්වෙන ත්‍රපීසියම හා ත්‍රිකෝණය එක් වීමෙන් $C$ රූපයේ දැක්වෙන සෘජුකෝණාස්‍රය සෑදී ඇත.




(i) $A$ රූපයේ දැක්වෙන ත්‍රපීසියමේ වර්ගඵලය සොයන්න.
(ii) $B$ රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.
(iii) $C$ රූපයේ දැක්වෙන සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය $A$ හා $B$ රූපවල වර්ගඵල ඇසුරෙන් සොයන්න.

3. රූපයේ දක්වා ඇත්තේ ත්‍රිකෝණ දෙකක් එක් වීමෙන් සෑදුණ වර්ගඵලය 33 $cm^2$ වූ ත්‍රපීසියමකි. එහි අඳුරු කර ඇති ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.




4. රූපයේ දැක්වෙන්නේ වර්ගඵලය 120 $cm^2$ වූ සමාන්තරාස්‍රයකි. එහි පරිමිතිය 64 cm වේ. දී ඇති තොරතුරු ඇසුරෙන් එහි,
(i) $CD$ පාදයේ දිග
(ii) $BC$ පාදයේ දිග
සොයන්න.

